00. 25

IHRA
UNIVERSITY OF COLOMBO

# මානව සම්පත් අභිවර්ධන ආයතනය
# කොළඹ විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව

## ශ්‍රම අධ්‍යාපන ඩිප්ලෝමා පරීක්ෂණය - 2014
## ප්‍රථම සෙමෙස්තරය
**(පවත්වන ලද්දේ 2015 නොවැම්බර්)**

# DY 01 – සිංහල

**විභාග අපේක්ෂකයින්ට උපදෙස් :**

(1) පහත දක්වා ඇති උපදෙස් පිළිපදිමින් පළමු ප්‍රශ්නය සහ තවත් ප්‍රශ්න හතරකට පමණක් පිළිතුරු සපයන්න.

(2) කාලය පැ තුනයි. (03)

(3) මෙම ප්‍රශ්න පත්‍රය ප්‍රශ්න අටකින් (08) සහ පිටු දෙකකින් (02) සමන්විතවේ.

(4) පිළිතුරු පත්‍රයේ සියලුම පිටුවල විභාග අංකය යොදන්න.

(5) විභාගය අවසානයේදී සියලුම පිළිතුරු පත්‍ර එකට ගැට ගැසිය යුතුය.

(6) ප්‍රශ්න පත්‍රයේ යම් පිටුවක් හෝ කොටසක් පැහැදිලිව මුද්‍රණයවී නොතිබේ නම් කරුණාකර වහාම ඒ බව ශාලාධිපතිට දැනුම් දෙන්න.

1. (අ) පහත දැක්වෙන යෙදුම්වල සදොස් තැන් ඇතොත් නිදොස් කොට ලියන්න.

i. විශ්වාසනීය සාධක
i. ප්‍රභල යන්ත්‍රණය
ii. වහා ගිනි ඇවිලෙන සුළු
iii. ගණන් මිණුම්
iv. සියලු ප්‍රශ්ණ
v. ධණේශ්වර ප්‍රතීපත්ති
vi. ධාරාණිපාත වර්ෂාව
vii. ප්‍රදර්ශන භාන්ඩ
viii. මද්‍යසාර මිශ්‍රනය
ix. ගැටළු නිරාකරණය
x. ව්‍යාපෘති කාර්‍යලය
xi. ශීඝ්‍ර ධාවණය
xii. ප්‍රතිචින ආභාෂය
xiii. දෘෂ්ටි විශේශඥ
xiv. ත්‍රෛයිමාසික වාර්තා
xv. දුර්ලභ ඖෂධ
xvi. සාරධර්ම පරිහාණිය
xvii. විශිෂ්ට සාමාර්ථය
xviii. කල්‍යාණි ස්ථූපය
xix. සෞන්ධර්ය ආස්වාදය

(ලකුණු 20)

(ආ) පහත දැක්වෙන වාක්‍යවල සදොස් තැන් ඇතොත් නිදොස් කොට ලියන්න.

i. අපි ශෝකවන්නේ නාය යාමෙන් අසරණ වූ අයට අත්වූ ඉරණම ගැනය.
ii. නිවාසයේ මිල අධික නිසා ඔවුන් එය මිල දී ගැනීමේ අදහස අත්හරියි.
iii. උපාධි අපේක්ෂයන් සිව් දෙනෙකු නව පාඨමාලාවට තෝරා ගන්නා ලදී.
iv. සියලු ම ශ්‍රී ලාංකිකයින් සමගි සම්පන්න වේවා
v. ජයග්‍රාහී ලොකු දුවගේ පැමිණීම අම්මා තුළ අමුතු ප්‍රබෝධයක් ඇති කළාය.
vi. ගුණපාල මුලින්ම පාසැලට ගෙන ගියේ සියදෝරිස් විසිනි.
vii. පන්සලේ නායක හාමුදුරුවන් බණ මඩුවට සැපත් වෙයි.
viii. විදුහල්පති තුමා වැඩිහිටි ශිෂ්‍යයන් නිතර පාසැලට නොපැමිණෙතියි වාර්තා කළහ.
ix. වතු පාලකයන් සේවකයින් අලුතෙන් බඳවා ගනියි.
x. මහවැලි ගංගා තොමෝ නිසලව ගලා බසින්නේය.

(ලකුණු 20)

2. බෝධිසත්වයින්ගේ ප්‍රඥාවේ මහිමය ප්‍රකාශ වන අවස්ථා තුනක් උම්මග්ග ජාතකයෙන් ගෙන හැර දක්වන්න.

(ලකුණු 15)

3. ගුත්තිල පඬිතුමාගේ චරිතයෙහි සුදන මෙන්ම දුදන ලක්ෂණ මතුවන අවස්ථා කීපයක් හඳුන්වා දෙන්න.

(ලකුණු 15)

4. "වැත්තෑවේ හිමියෝ අවස්ථා කීපයකදීම ගුත්තිල ජාතකය වෙනස් කරති" මෙහි සත්‍යාසත්‍යතාව විමසන්න.

(ලකුණු 15)

5. "නොයෙක් අඩුපාඩු ඇතත් වීරසේකරත් සුදුහාමිනේත් පාඨකයන්ගේ අනුකම්පාව දිනා ගනිති" යශෝරාවය ඇසුරින් විමසන්න.

(ලකුණු 15)

6. කෙටි කතා රචනයෙහි ලා ජී. බී. සේනානායක දක්වන කුසලතා "හෘදය වස්තුව" සහ "කාන්ති" යන කෙටි කතා ඇසුරින් විමසන්න.

(ලකුණු 15)

7. ස්වකීය අනුභූතිය මැනවින් ප්‍රකාශ කිරීම සඳහා නිදහස් කවීන් භාෂාව යොදා ගන්නා ආකාරයෙහි විශේෂත්වය පිරික්සන්න.

(ලකුණු 15)

8. පහත දැක්වෙන කවි පෙළෙහි සාහිත්‍යමය අගය විමසන්න.

**දිසාපති කාමරයේදීය**

| | |
|---|---|
| එක යුගයක ජීවිතයේ සරතුස නිවූ මා | සුමිතුර |
| දුර හිඳිනා ඔබ දකින්න ආයෙමි දිගු කලකට | පසු |
| | |
| බමන විදුලි පංකාවෙන් වා ගැබ කැළඹෙන හඬ | මීස |
| එ සඳ ඔබේ මුව'ග නැගුණු සාද තෙපුල් නෑසේ | මට |
| | |
| මේසය මත ලිපි ගොනු රැස සුළඟෙ නොයාදී | රකිමින |
| ඒ මත හිඳිනා ගල සේ මා අබියස නිහඬය | ඔබ |
| | |
| බිත්තියෙ ඇති සේයා රූ එකිනෙක එබී එබී | බලයි |
| නැතියෙන් ඔබෙ වත හසරැලි මදෙස ලබා සිනා | නඟයි |
| | |
| බාලේ අපි ගම් දොර කෙළි මඩුළු මැදින් ආ | ගමනේ |
| මහදේ ඇඳි ඔබෙ සිතුවම කොහි සැඟවීණි දැයි | නොදැනේ |
| | |
| එක යුගයක ජීවිතයේ සරසත නිවූ මා | සුමිතුර |
| ඔබ අසලින් බැහැරව යමි කුමටද ඔබගේ | අවසර? |

-මොනිකා රුවන්පතිරණ

(ලකුණු 15)